# සතිමත් වසිලිස්සා

ඉන්ද්‍රාණී තිලකරත්න

# පෙරවදන

මේ ලෝකයේ උපදින බොහෝ මිනිසුන් තව කෙනෙකුගේ පිහිටෙන්, ආශිර්වාදයෙන්, ආධාරයෙන් තම ජීවිතය ගොඩනගා ගැනීමට බොහෝ විට පෙළඹේ. එය එසේ වන්නේ නම්, එය ද, යහපත් දෙයකි. නමුත් එය සැම විට ම එසේ වේ යයි අපේක්ෂා කළ නොහැකි ය. මෙම පොතෙහි අපට කියා දෙන්නේ වසිලිස්සා ඇයගේ ජීවිතය ජය ගැනීමට මවගෙන් ඇයට ලැබුණු සතිමත් බවේ දායාදය තම කටුක අත්දැකීම් සහිත ජීවිතයට යොදාගත් ආකාරය යි. මෙම සතිමත් බවේ දායාදය අප සැමගේ ජීවිතවලට ද එක සේම ළඟාකර ගත හැකි බව අප ද අත්දැකීමෙන් දනිමු. සති පාසල වෙනුවෙන් මෙම අගනා ලේඛනය මුද්‍රණය කිරීමට පූජ්‍ය ධම්මවිහාරී ස්වාමීන්වහන්සේ විසින් ගන්නා ලද උත්සාහය සහ කාලය අපි අගය කරමු.

සතිමත් බවේ පණිවිඩය නිර්මාණාත්මක ව ජනගත කිරීමට උත්සාහ දැරූ මනෝවිද්‍යා උපදේශිකා ඉන්ද්‍රාණි තිලකරත්න මහත්මියගේ උත්සාහය සාර්ථක යැයි අපට හැඟේ.

මෙයට,

සති පාසල පදනම නිර්මාතෘ,

නිස්සරණ වන සේනාසනාධිපති,

කම්මට්ඨානාචාර්‍ය,

**අති පූජ්‍ය උඩුර්රියගම ධම්මජීව ස්වාමීන්වහන්සෙ**

2024.04.29.

# ස්තුතිය

2005 වර්ෂයේ පටන් අද වන විට පුරා වසර 19ක කාලයක් රෝහල් ආශ්‍රය කරගනිමින් මනෝවිද්‍යා උපදේශන ප්‍රතිකාර සිදු කිරීමේ දී මා වෙත යොමු වූ දරු දැරියන් බොහෝ ය. විවිධ වූ මනෝ-සාමාජීය ගැටලු හේතුවෙන් පීඩාවට පත් ව සිටියා වූ එම දරුවන්ගේ ඇතැම් ඉතිහාස කථා ඔවුනගේ මව්කුස දක්වා ම දිවයන අතර, වර්තමාන සමාජ ආර්ථික වටපිටාව ඔවුන් ලද හිංසනයන්ගේ පාර්ශ්වකරුවකු ලෙස පෙනී සිටී.

මෙවන් දුර්භාග්‍යසම්පන්න සමයක ප්‍රතිකාර ලබාදෙන්නවුන් ලෙස අප ද දැඩි අසරණ භාවයකට පත් ව සිටින අතර, එකී දරුවන්ගේ සිහිය බලගන්වා සති බලයෙන් ලෝකය දිනීමට එම දරුවන්ගේ කායික මානසික සුභ සාධනය සාඳහා අති පූජනීය උඩුඊරියගම ධම්මජීව ස්වාමීන්වහන්සේ විසින් සති පාසල ආරම්භ කරන ලදි. අද වන විට ලංකාව පුරා දීප ව්‍යාප්ත ව පැවැත්වෙන මෙම සති පාසල බාල මහලු වැඩිහිටි සියල්ලන්ට ම මහත් අස්වැසිල්ලක් බවට පත් ව ඇත.

එබැවින් සති පාසලේ නිර්මාතෘ අති පූජනීය උඩුඊරියගම ධම්මජීව ස්වාමීන්වහන්සේ සහ දැනට එහි භාරදූර කර්තව්‍යයක් භාර ව සිටින්නා වූ පූජනීය අතුරුගිරියේ ධම්මවිහාරී ස්වාමීන්වහන්සේ ඇතුළු මුළු මහත් සති පාසල් කාර්ය මණ්ඩලයට ම කෘතගුණ සලකනු වස් මෙම පොත් පිංච නිර්මාණය විය.

එසේම, මේ සඳහා ඇසුරුකොට ගත් රුසියානු සුරංගනා කථාවේ මුල් අයිතිකරු වන ඒ. එන්. අපනාසියෙව් නම් කෘතහස්ත ගත් කතුවරයාටත් එය සිංහලට පරිවර්තනය කර ලාංකේය දරු පරපුරට දයාද කළ වෛද්‍ය දැදිගම වී. රුද්‍රිගු මහතාටත් මාගේ හද පිරි ගෞරවය පුදකර සිටිමි. එහි දී බාල කාලයේ අපූර්ව චිත්තරූප මවමින් අසිරිමත් ලොවකට මා ද රැගෙන ගිය සුන්දර කථාවක් ලෙස "ලස්සන වසිලිස්සා" දක්වනු කැමැත්තෙමි.

එසේම, හදිසි තීරණයක් මත දින දෙකක් තරම් කෙටි කාලයක දී මෙම පොතේ පිටු සකසා පොත නිර්මාණයට දායක වූ ප්‍රමුදිත ග්‍රැෆික්ස් ආයතනයටත්, මෙහි හරි වැරදි සොයා බලා නිවැරදිකර දුන් ආචාර්ය රවීන්ද්‍ර රණසිංහ ඇදුරුතුමාටත්, මේ සඳහා චිත්‍ර සපයා දුන් බප/කැල/විහාරමහාදේවී බාලිකා විද්‍යාලයේ 12 වසර ඉගෙනුම ලබන දහම්දි සෙතංගා දියණියටත්, එක් දිනක් තරම් කෙටි කලක දී පිටපත් ගණනාවක් මුද්‍රණයකර දුන් නියෝ ග්‍රැෆික්ස් ආයතනයටත් යතුරු ලියනය කිරීමෙන් සහාය ලබා දුන් මාගේ බාල පුතු සුදම් හටත් හද පිරි ස්තුතිය පුදකර සිටිමි.

**ඉන්ද්‍රාණී තිලකරත්න**
උපදේශන මනෝවිද්‍යාඥ
මනෝවිද්‍යා උපදේශිකා
ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල
2024 මැයි 03 දින දී ය.

# සතිමත් වසිලිස්සා

ඉර හෙම්හෙම්හිට අවරෙගිරේ හැංගෙනවා. සීතල මීදුම ටිකෙන් ටික කැළණි ගං ඉවුරේ තිබුන පුංචි වසිලිස්සගෙ පැල ඇතුලට රිංගා ගත්තා. හනිහනිකට දොර කවුලු වසා දැමූ වසිලිස්සා ලාම්පුව දල්වන්න හදනකොට අම්මගෙ කෙඳිරිල්ල ඇසුනා. ඇය අම්මා ළඟට දිවගෙන ගියා. ලා අඳුර අතරින් අම්මගේ සුදුමැලි මුහුණ වසිලිස්සාට පෙණුනා. ඇය ලාම්පුවේ දැල්ලට ගිනිකූර ළං කරලා තිරය ටිකක් උඩට අදිමින් එළිය වැඩි කළා.

බ්ලැන්කේට්ටුව අරගෙන අම්මාව පොරවලා උණුසුම් යමක් බීමට ගේන්න යන්න සැරසුණා. අම්මා ඇයගේ අත තදින් අල්ලා ගත්තා. වසිලිස්සා නතර වුණා. කෙඳිරිලි හඬ අතුරින් අම්මා වසිලිස්සාට කතාකරා.

“දුවේ... දැන් ඔයාටත් හය හතර තේරෙනවානේ, මට තවත් කල් මේ පණ ටික අල්ලගෙන ඉන්න බැරි වේවි. මම මියැදුනොත් තාත්තාවත් බලාගෙන හොඳින් කල් ගෙවන්න ඕනා. මොකද, දවසක ඔයා තරුණියක්

වෙනවා. ඉන් පස්සේ ලොකු ගැහැණියක් වෙනවා. ඒ ගමන ඒ තරම් ම සුන්දර නොවෙන්න පුළුවන්. ඒත් ඔයාට ඒ ගමන යන්න ම වෙනවා දුවේ. ඉතින් ඒ ගමනට උදව්වක් වන අපූරු තෑග්ගක් අද මම ඔයාට දෙන්න හිතුවා. ඒ තෑග්ග ළඟ තියෙනවා නම් මොනතරම් දුෂ්කර ගමනක් වුනත් පහසුවෙන් යන්න පුළුවන් වේවි."

වසිලිස්සාගේ අත්ල හොඳින් ස්පර්ශ වන ලෙස මව ඇගේ අත අල්වා ගත්තා.

"දැන් මොනවද ඔයාට දැනෙන්නේ?" අම්මා හෙමිහිට කෙඳිරුවා. සුදුමැලි වුණ මවගේ දකුණතේ සීතල ගතිය වසිලිස්සාට දැණුනා.

"ඔයාගේ අත හරිම සීතලයි," වසිලිස්සා කීවා.



"මගේ අත සීතල නෙමෙයි, ඔයාගේ අත මේ මොහොතේ මගේ අතට වඩා උණුසුම්. ඒකයි මගේ අත සීතලට දැනුණේ." අම්මා එහෙම කියන කොට සීත නිසා උණුසුම දැනෙන බවත් උණුසුම නිසා සීත දැනෙන බවත් වසිලිස්සාට තේරුණා.

"අනේ ඔව් මට තේරුණා," වසිලිස්සා හඬ තැලුවා.

"මොනවා ද ඔයාට තේරුණේ?" අම්මා වෙව්ලන ස්වරයෙන් ඇසුවා.

"එකක් නැතිකොට අනෙක තියෙනවා. ඒ කියන්නේ දුක නැතිවෙනකොට සතුට දැනෙනවා. ඒත් ඉතින් සතුට නැතිවෙනකොට... දුක ආයිත් එනවා." වසිලිස්සා හැඟුම් බර වුණා.

"ඇයි, ඒ දෙක මැද තව දෙයක් තියෙනවා. "

"ඒ මොකක්ද අම්මේ?"

"දුකත්, සතුටත් දෙක ම නැති තැන."

"එහෙම එකකුත් තියෙනවා ද?"

"ඔව්, ඒ තමා අදුක්කම සුඛ"

ඒකෙන් ඇති වැඩේ මොකක් ද, වසිලිස්සා කල්පනා කළා.

"ඒක හුඟක් අය නොදන්නා දෙයක්. ඇත්තට ම කියනවා නම් මිනිස්සු ඒකට හරි ම බය යි. නමුත් කවදා හරි ඔයා දැනගත්තොත් මේ වෙලාවේ තමුන් ඉන්නේ දුක, සතුට දෙක ම නැති තැනක කියලා, එදාට ඒ සතුට ඔයා හොඳින් අඳුන ගනීවි."

"කොහොම ද මම ඒක හොයා ගන්නේ?"

"ඔව්, ඒකට ඉන්න හොඳ ම යාළුවා මම අද ඔයාට අඳුන්නලා දෙනවා."

"ආ... ඒ කවුද?"

"සතිමත් බව, සිහි ඇති බව, ඒ කියන්නේ අතීතය හාරන්නේ නැති, අනාගතය ගොඩ නගන්නේ නැති මේ මොහොත."

"මේ මොහොත! මම කොහොම ද ඒක හොයා ගන්නේ."

"හරිම ලේසි, ඔයා අද ඉඳලා කරන හැම වැඩක් ම හෙමිහිට, සිහියෙන්, නිහඬ ව කරන්න පුරුදු වෙන්න ඕනා."

"හෙමිහිට, සිහියෙන්, නිහඬ ව කරන්න! ... කොහොමද අනේ, එහෙම වැඩ කරන්නේ? අම්මා එහෙමනම් මට ඒක කියලා දෙන්න."

"ඔයාට මොනව ද නැතුව ම බැරි දේ?"

"කෑම"

"කෑමටත් වඩා?"

"ආ... වතුර, වතුර"

"වතුරටත් වඩා?"

"වතුරටත් වඩා මොකක් ද? මී... මතක් වුණා! ... හුස්ම නේද? ඒ කියන්නේ වාතය."

"අන්න හරි, ඔයා දවස පුරා ම කරන වැඩක් තියෙනවා, ඒ තමා හුස්ම ගන්න එක. ඒත් ඔයා අදින් පස්සේ ඉගෙන ගන්න ඕනා හෙමිහිට, සිහියෙන් ඔයාගේ ගිරා කට වහගෙන හුස්ම ගන්නේ කොහොම ද කියලා."

"හරි, ඊට පස්සේ තව මොනව ද?"

"නිවනක් නැතිව ගං ගොඩේ ඇවිදින ඔයාගේ ඔය කකුල් දෙකටත් වැඩක් තියෙනවා."

"ඒ මොකක්ද?" වසිලිස්සා නොඉවසිලිමත් දෑසින් මව දෙස බැලුවා.

"අදින් පස්සේ කලබල නැති ව සිහියෙන් ඇවිදින හැටිත් ඔයා ඉගෙන ගන්න ඕනෑ. මම නැති වුණාට ඔයාට ඔය ඔක්කොම ටික ඉගෙන ගන්න තැනක් තියෙනවා."

"ඒ කොහෙද අම්මේ?"

"ගඟේ එහා පැත්තේ තියෙන සති පාසලෙන්"

"සති පාසල ! ..."

"ඔව් මගේ හොඳ වසලිස්සා මම නැති වුණ දාට මම අද ඔයාට හඳුන්වලා දුන්න සති යාළුවා ඔයාට එහෙදී හමු වේවි. ඒක තමයි මම අද ඔයාට දෙන ලොකුම තෑග්ග."

මවගේ හඬ දැන් ඉතා දුර්වල ය. ඇය හුස්ම ගන්නේ ද අපහසුවෙනි.

"අනේ අම්මේ ඔයාට අමාරුයි වගේ. ඉන්න මම සිද්ධාර්ථ තෙල් ටිකක් පපුවේ ගාන්නම්."

"එපා පුතේ, සතිය පුරුදු කරපු නිසා මම දන්නවා මේ හුස්ම රැල්ලට තවත් කාලයක් මේ ශරීරය එක්ක ඉන්න බැරි බව. මට මේ හුස්ම රැල්ලත් එක්ක යන්න වේවි. ඊට කලින් ඔයා මට පොරොන්දුවක් වෙන්න ඕනෑ."

"අනේ අම්මේ කියන්න මොකක් ද ඒ?"

"සති පාසලට ගිහින් සති යාළුව ව හොයා ගන්නවා කියලා."

“මම පොරොන්දු වෙනවා අම්මේ.” වසිලිස්සා මවගේ අත තදින් අල්ලා ගත්තා.

ඒ මොහොතේ දෑස් පියාගත් මවගේ හුස්ම රැල්ල අවකාශයට එකතු වූ පසු නැවත සිරුර බලා නොපැමිණුන බව වසිලිස්සාට තේරුණා.

“අනේ අම්මේ මාව දාලා යන්න එපා! ...” වසිලිස්සා ඉකි බිඳිමින් අඬන්නට උනා.

මවගේ මියයාම සමඟ නිවසේ තනි වුණ වසිලිස්සා ඇයට පුළුවන් හැටියට අහර පිසුවා, ගේ දොර වැඩත් කරගත්තා. නමුත් අම්මාට වුණු පොරොන්දුව නිසා සෑම ඉරු දිනක ම හවස් යාමයේ සති පාසලට ගියා. ටිකෙන් ටික කාලය ගත වුණා. දැන් වසිලිස්සා සිහියෙන් ඇවිදිනවා, හුස්ම එක්ක යාළුවෙලා ඉන්නත් හොඳට ම දන්නවා. ඒ විතරක් නෙමෙයි සිහියෙන් කන්න, බොන්න, නාන්න වගේ ම සෙල්ලම් කරන්නත් දන්නවා. සති පාසලේ යාළුවන් එක්ක සති ක්‍රීඩා කරලා මේ පාර වසිලිස්සාගේ විභාගේ ලකුණුත් වැඩි වෙලා.

“මම මේ පාර පන්තියේ පළමුවෙනියා! ...” තාත්තාට ඇසෙන සේ වසිලිස්සා උජාරුවෙන් කීවා.

“මගේ දරුවාට තුණුරුවන්ගේ ම සරණයි! උඹේ අම්මා කොහේ හරි ඉඳන් උඹ දිහා බලන් ඇති පුතේ.”

“පිස්සු ද තාත්තේ! අම්මා මෙහේ නතර වුණේ නෑ, සතිය පුරුදු කරලා හිටිය නිසා එයා හුස්ම රැල්ල එක්ක යන්න ගියා.”

“මේකි දැන් හොඳට ම පැහිලා. සති පාසලේ හාමුදුරුවෝ ද උඹට ඕවා ඉගැන්නුවේ.”

"නෑ... " වසිලිස්සා බරසාර ව උත්තර දුන්නා.

"එහෙනං කවුද, උඹට ඕවා කියලා දුන්නේ?"

"මගේ සති යාළුවා තමයි මට ඕවා තේරුම් කරලා දෙන්නේ" තාත්තා ආදරයෙන් ඔළුව අතගාලා වසිලිස්සාව ළඟට ගත්තා.

"මම පුතේ උඹට කියන්නමයි හිටියේ, දැළි කුණු පෙරාගෙන උයන්නයි රෙදි සෝදන්නයි ඉගෙනගන්නයි ඔක්කෝ ම එකට කරන්න බැරි එකේ, මම හිතුවා නුඹට කුඩම්මා කෙනෙක් ගෙනත් දෙන්න."

"කුඩම්මා කෙනෙක්! ..." වසිලිස්සා ප්‍රශ්නාර්ථ බැල්මකින් තාත්තා දිහා බැලුවා.

"අනේ ඔව් පුතේ, උඹේ තනි නොතනියටත් එක්ක කුඩම්මා කෙනෙක් කැන්දන් එන්න කියලා මං හිතුවා."

"මගේ තනියට, කමක් නෑ කවුරු හිටියත් නැතත් මට දැන් අමමා තෑගි කරපු සති යාළුවා ඉන්නවනේ." වසිලිස්සා තනිය ම හිතුවා.

ඔන්න කුඩම්මා ගෙදර ආවා. වසිලිස්සා එක්ක ටිකක් කල් ආදරයෙනුත් සිටියා. ඒත් ඔන්න කුඩම්මටත් නංගියෙක් උපන්නා. එයා ටිකක් ලොකු වෙනකොට තවත් නංගියෙක් උපන්නා. කුඩම්මාට ගෙදර වැඩ එක්ක නංගිලා බලා ගන්න බැරි වුණා. තාත්තා දවසක් වසිලිස්සාට කතා කරලා මෙහෙම කිව්වා.

"කුඩම්මාට දැන් වැඩපළ කර ගන්න අමාරුයි. උඹේ ඔය ඉස්කෝලේ පළවෙනියා දෙවෙනියා පැත්තකට දාලා නංගිලා බලා ගන්න දැන් ගෙදර නැවතුනොත් හොඳා.

මටත් මේ කුඹුරේ වැඩපල නිසා ඉස්පාසුවක් නැහැනේ. උඹ කුඩම්මාට ටිකක් උදව් වෙයන් දුවේ."

"එතකොට සති පාසල? "වසිලිස්සාට නිකමට ම කියවුණා.

"ආය ඉතින් සතියෙක් ගැන කතා කරනවා. මින් මනත උඹ ගෙයින් පිට කොහෙවත් යන්නේ නෑ, කුඩම්මාට උදව් වෙයන්."

වසිලිස්සාගේ දෑස් අග කඳුලු බිඳුවක් දිලිසුනා. පාසල් යාම නතර වුනාටත් වඩා සති පාසලට යාමට නොහැකි වීම තමයි එයාගේ ලොකු ම දුක. වසිලිස්සා දිග හුස්මක් හෙලුවා.

"කමක් නෑ, දැන් සතියයි මමයි යාළුයි නේ. මම කොහේ ද සතිය එතන. මෙහෙණින් වහන්සේ කියා දුන් විදිහට ගෙදර වැඩ සතියෙන් යුතුව කරනවා. එතකොට ඉතින් පැය විසිහතර ම සති පාසල් ගියා වගේ තමා." වසිලිස්සා තමාට ම කියා ගත්තා.

වසිලිස්සා දැන් ටික ටික ලොකු වෙනවා. හරිම ලස්සනයි. දකින දකින හැමෝ ම ඇයට ආදරෙයි. කුඩම්මාගේ දුවලා දෙන්නා පුංචි වුණාට හරි ම නපුරුයි. ගමේ හැමෝ ම අහන්නේ වසිලිස්සා ගැනයි. කුඩම්මාට ඒකට හරියට තරහා ගියා.

"මේකි නිසා මගේ දරුවන්ට කවදාවත් සුගතියක් වෙන්නේ නෑ. මුන්ගේ තාත්තත් ආදරේ වසිලිස්සාට ම තමයි. හොඳ වැඩක් කරන්නම්කෝ" කුඩම්මා රෑ දවල් නැති ව වසිලිස්සා ගෙදරින් පන්න ගන්න විදිහක් කල්පනා කළා. මොකද එයාලා දැන් මේ ජීවත්වෙන ගේ දොර

හැමදෙයක් ම වසිලිස්සාගේ අම්මාටයි අයිති. ඒ කියන්නේ වසිලිස්සාටයි අයිති. ඒත් ඉතින් වසිලිස්සා නැතිනම් හැමදේම අයිති වෙන්නේ එයාගේ දූලා දෙන්නටයි. ඔහොම ඉන්නකොට දවසක් කුඩම්මාට හොඳ අදහසක් පහල වුණා.

"දුවේ ... වසිලිස්සා ... මෙහෙ වරෙන් කෙල්ලේ."

"කුඩම්මා අද මොකාටද දන්නෑ එන්න හදන්නේ, අඬගහපු විදිහ නම් හොඳ වැඩී," වසිලිස්සාට හිතුණා.

"එනවා කුඩම්මේ ...."

"කෙල්ලේ, අද අපි දෙන්නා දර ටිකක් හොයන්න මහා ඇළෙන් එගොඩ කැලේට යමු කියන්නයි කතා කළේ." වසිලිස්සාගේ ඉහේ මලක් පිපුණා වගේ. මොකද? එගොඩ හැදෙන බෝවිටියා, දඹ වගේ කැලෑ ගෙඩි කන්න යන්න වසිලිස්සා හරිම කැමති. ඔන්න දෙන්නත් එක්ක ලොකු ඒදණ්ඩෙන් එගොඩ වෙලා කැලේට රිංගුවා. දර එකතු කරලා කුඩම්මා දර මිටි දෙක තුනක්ම පොඩි පොඩියට බැන්දා.

"ඔය දං ගෙඩි ඇහින්දා දැන් ඇති. ඉර මුදුන් වෙන්නත් එනවා." වසිලිස්සාගේ ගවුම් සාක්කුව දම් පාට වෙලා. දං ගෙඩි වගේම බෝවිටියා ගෙඩි පොඩි වුණාම හරිම ලස්සන යි. කුඩම්මා වසිලිස්සා දිහා අමුතු බැල්මක් හෙලුවා.

"මොකක් හරි කපටි වැඩකට අර අඳින කොට කුඩම්මාගේ මූණ ඔය වගේ තමයි." වසිලිස්සා තනියම හිතුවා.

"අනේ කෙල්ලේ, මගේ මේ කකුල් අමාරුව නිසා මට මේවා ගඟෙන් එගොඩට ගෙනියන්න අමාරුයි, ඒකයි මම පොඩි පොඩි දර මිටි බැන්දේ. හොඳ කෙල්ල වගේ උඹ මේ ටික ඒදණ්ඩෙන් එහාට ගෙනත් දුන්නා නං" වසිලිස්සාගේ ඇස් උඩ ගියා.

"අනේ! ... දර මිටිත් අරන් ඒදණ්ඩේ යන්න, මම කොහොම ද ඒක කරන්නේ? අනේ කුඩම්මේ මාව දියට වැටෙයි." වසිලිස්සා හැඬුම් බරව පැවසුවා.

"මටත් ඕනා ඒකම තමයි," කුඩම්මා හිත යටින් පවසමින්,

"මේ ... මේ ... ඔය කතා දැන් වැඩක් නෑ. ඇයි අප්පේ, කතාවට ගියාම උඹ මහා සමතනේ. හැමදේම හරි සිහියෙන් කරනවා කියන්නේ. ඉතින් ඕකත් බැරියෑ සිහිකල්පනාව ඇතිව කරන්න." කුඩම්මාගේ අකාරුණික බව වසිලිස්සාගේ හිත හොඳටම රිදෙව්වා. ඒත් ඉතින් සිහිකල්පනාව මතක් කරපු එකට නම් පින් දෙන්න හිතුනා.

"මට වතුර බඳුන හිසේ තියා ගෙන ඉර දිගේ ඇවිදින්න පුළුවන් එකේ, ඔන්න ඔහේ මේකත් කරලා බලනවා." වසිලිස්සා තමාට ම කියා ගත්තා.

"ඕන් එහෙම නම් මම යනවා. උඹට පුළුවන්නේ දර ටික එගොඩට ගේන්න." වසිලිස්සා හිස වැනුවා.

"අද මේකි ගෙදර එන්නේ නෑ. කැලණි ගඟට වතුර ගලාගෙන යන මේ ලොකු ඇළේ වතුර පාර අද හරි ම සැරයි. මේකි දියට වැටුණොත් ගොඩ ගන්න වෙන්නේ කැලණි ගඟෙන් තමා." ඇය හිත යටින් සතුටු වුණා.

වසිලිස්සාට සති පාසලේ හැමෝ ම මතක් වුණා. "අනේ අම්මේ, සති යාළුවාට මා එක්ක ම ඉන්න කියන්න.



කුඩම්මාගෙන් ගුටි කන්න බෑ. මේක මම කොහොම හරි එගොඩට ගෙනියන්න ඕනෑ.” එතැන තිබුණු පුංචිම දර මිටිය හිසට ගත්ත වසිලිස්සා, හෙමිහෙම්හිට සීරුවෙන් ඒදණ්ඩ උඩ ගමන් කරන්න වුණා.

එක් පාදයක පතුළ ඒදණ්ඩ බදා අල්ලා ගන්නා විට, අනෙක් පාදය එසවිලා ඉදිරියට ඇදෙන සැටි දැන් වසිලිස්සාට හොඳට දැනෙනවා. ඇය හිස මත ඇති දර මිටිය දකුණතින් හිරට අල්ලාගෙන සිටිනවා. වම් අත නිදහසේ තියාගෙන යනවා, අවශ්‍ය වුණොත් ආධාරක ලණුව අල්ලන්න ඕන නිසා. වසිලිස්සා සීරුෑ මාරුවට ඒදණ්ඩෙන් ඇවිද යනවා. දර මිටිය සමබර නිසා බර ඒ තරමටම දැනෙන්නේ නෑ. මඟක් දුර යන විට ඇයට මොකක්දෝ පහසුවක් දැනෙන්න පටන් ගත්තා. හිතේ බයත් නැති වුණා. අනේ සති යාළුවට පිං සිද්ධ වෙන්න ඕන. වසිලිස්සා දර මිටියත් අරන් මෙගොඩට ආවා. ඒක මෙගොඩින් තියලා, අනෙක් එක ගේන්න ආයිත් ගියා. ඉතින් මේ විදිහට තුන්වැනි දරමිටිය අරගෙන එනකොට ඇය කලින් ගෙනා දරමිටි දෙක ම එතැන තිබුණේ නෑ. ඇය හොඳට ම බය වුණා. අද නම් කුඩම්මාගෙන් හොඳට ම ගුටි කන්න වෙනවා. ඇයට හැඬුම් ආවා. ඒත් ඇය සිත තදකර ගත්තා. දර මිටියත් අරගෙන ගෙදර ගියා. හැමදේම හොරෙන් බලා හිටිය කුඩම්මා තරහෙන් පුපුර පුපුර ඉස්සරහට ආවා. ඇගේ ඇස් රතුවෙලා. “එහෙනම් මේකි පණපිටින් ආයෙත් ගෙදර ආවා.” ඇය මැතිරුවා.

“මෙච්චර වෙලා උඹ මොකද කළේ ? කෝ අනිත් දර මිටි දෙක ?”

“අනේ කුඩම්මේ මං ඒවා මෙගොඩට ගෙනාවා. ඒත් දැන් ඒවා එතැන නෑ.”

“අනේ බොල මාව රවට්ටන්න හිතුවද? උඹ ඒවා වතුරට වට්ටලා මට දැන් බොරු කියනවා නේද? හිටපිය, හිටපිය මම උඹට හොඳ වැඩක් කරන්නම්කෝ” කියලා, ඒ

දර මිටියේ ම තිබුණු දර කෝටුවක් ඇදලා ගත්ත කුඩම්මා ඉන් ඇයට තලන්න පටන් ගත්තා.

"අනේ කුඩම්මේ මං කවදාවත් බොරු කියන්නේ නෑ." ඇය අඬමින් කෑගසන්නට වුණා. ඇත්තම කියනවා නම් මේ දර මිටි ගේන දිහා පුදුමයෙන් බලා සිටි කුඩම්මා ම තමයි ඒවා හැංගුවේ. ඒ ඇයට දඬුවම් කරන්න හිතාගෙන. වසිලිස්සාගේ කකුල් දෙකෙන් ලේ ගලනවා. ඇය ගෙදරට දුවලා කාමරේ දොර වසා ගත්තා. කුඩම්මා දොරට ගහලා ගහලා, බැණ බැණ යන්න ගියා.

වසිලිස්සා එගොඩට දර එකතු කරන්න ගිය වෙලේ ඉඳන් ඇය ගැන ඇහැගහගෙන හිටිය චාමර ගුරුතුමා කුඩම්මා ඇයව තනියම දාලා ආව නිසා ඇය කළ දේ සියල්ල බලා සිටියා. ඒ විතරක් නෙමෙයි, එයාගේ ජංගම දූරකථනයේ කැමරාවෙන් වසිලිස්සාගේ මේ අපූරු සතිමත් ක්‍රියාව සටහන් කරගත්තේ ඔහුගේ සති පාසලේ අනෙක් අයටත් ඒ ගැන කියාදෙන්න හිතාගෙනයි. ඒ වගේමෙ එහි කුඩම්මාගේ අනපේක්ෂිත පහර දීමත් චාමර ගුරුතුමා හෙම්හිට පටිගත කරගෙන තිබුණා.

දවල් වෙනකොට වසිලිස්සාට ගිනිරාමෙට උණ. ඒ අතර ජීප් රියක් එන ශබ්දය ඇසුණා. එය ආවේ වසිලිස්සාගේ ගෙදරට. පොලිස් නැන්දා කෙනෙකුයි, තවත් කට්ටියකුත් ඇවිත් කුඩම්මාගෙන් ප්‍රශ්න කරන්න පටන් ගත්තා. ඉන් පස්සේ එයාලා එක්ක ආව තවත් නැන්දා කෙනෙක් පොලිස් නැන්දත් එක්ක එකතුවෙලා වසිලිස්සා ව ළඟ ම තිබුණු රෝහලට රැගෙන ගියා. ඒ ඇවිත් තිබුණේ ළමා ආරක්ෂක අධිකාරියේ අය. චාමර ගුරුතුමා 1929 අංකයට කතා කරලා උදේ වෙච්ච දේ ළමා ආරක්ෂක අධිකාරියට දන්වපු නිසයි මෙහෙම වෙලා තියෙන්නේ.

ඔන්න ඉතින් බොහොම අමාරුවෙන් තාත්තා දුක කියලා කුඩම්මා ව ඇප දීලා නිදහස් කරගෙන තිබුණා. වසිලිස්සාවත් එදාම උසාවියට යොමු කරලා තිබුණා. පරිවාසෙට බාර දෙන්න හැදුවහම වසිලිස්සා වෙනුවෙන් සති පාසලේ මෙහෙණින් වහන්සේ ඉදිරිපත් වුණා. ඇගේ මව ජීවත් ව සිටිය දී ඇයට දීලා තිබුණු ලිපියක් උසාවියට ඉදිරිපත් කළා. එයින් වසිලිස්සාගේ භාරකාරත්වය මෙහෙණින් වහන්සේ ඇතුළු සති පාසලේ ගුරුවරුන් වෙත බාර දී තිබුණා. ඉතින් මෙහෙණින් වහන්සේ ඇයව ආරාමයට කැඳවාගෙන ගියා. පරිවාසේ නැන්දා කෙනෙක් සති දෙකකට පාරක් වසිලිස්සා බලන්න ආරාමයට ඇවිත් යනවා.

දැන් වසිලිස්සා ආයෙත් පාසල් යනවා. වසිලිස්සාට දැන් කිසිම අඩු පාඩුවකුත් නෑ. මොකද සති පාසලෙන් ඇයට ශිෂ්‍යත්වයක් ලැබුණු නිසා. පන්ති ගාස්තුයි හැම දේම ඒකෙන් කරගන්නවා. ඉතින් ඔහොම ටික ටික කාලය ගත වුණා. හැමදේට ම දක්ෂ වුණු වසිලිස්සා පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාවත් වුණා. ඔන්න ඉතින් මේ පාර උසස් පෙළ විභාගයට ජීව විද්‍යා අංශයෙන් ඉදිරිපත් වුණු වසිලිස්සා ඒ සාමාර්ථ තුනකුත් එක්ක විභාගය ඉහලින් ම සමත් වෙලා. සති පාසලේ හැමෝටම හරිමෙ සතුටු යි. මේක දැනගත්තු තාත්තාත් කඳුළු පිරි දෙනෙතින් වසිලිස්සා දිහා බලා උන්නා. මගේ අම්මා වගේ මැරෙන්න හදන අයව මට දැන් සුවකරන්න පුළුවන් වේවි. වසිලිස්සා දිගු සුසුමක් අතරේ විශ්වාසයෙන් කීවා.

හැමෝ ම එහෙමෙහෙ වුණාට පස්සේ මෙහෙණින් වහන්සේ වසිලිස්සා ළඟට ආවා. මොකක්දෝ පුංචි පාර්සලයක් වසිලිස්සා අතේ තියලා, "ඔයාගේ අම්මා මට අද වගේ දවසක් ආවා ම ඔයාට මේක දෙන්න කිව්වා."

කියලා යමක් ලබා දුන්නා. වසිලිස්සාගේ හිතට ලොකු සතුටක් දැනුණා. “අම්මා දුන්නා ? ...” ඇය නොඉවසිලිමත්ව ඒ පුංචි පාර්සලය දිගහැරියා. ඇතුළේ තිබුණේ පරණ පොතක්.

“මොකක් ද මෙහෙණින් වහන්ස මේ ?” ඇය පොත අතට ගත්තා.

“ලස්සන වසිලිස්සා”



"අනේ, මේක අම්මාගේ ද? මට මතකයි මං චූටි දවස්වල සමහර වෙලාවට අම්මා ඔයා වගේම ලස්සන වසිලිස්සෙක් මීට ගොඩාක් කාලෙකට කලින් හිටියා කියලා කතන්දර කියනවා."

"ඔව් පුතේ, ඔයාගේ අම්මා ඔය පොතට වගේම නමටත් හරිම ආසයි. ඒ නිසයි එයා ඔයාටත් වසිලිස්සා කියලා නම තියලා තියෙන්නේ."

"ඒත් ඇයි ඉතින් අම්මා මේක මට කලින් නොදුන්නේ?"

"ඒක දිග කතාවක් පුතේ." මෙහෙණින් වහන්සේ කල්පනාවට වැටුණා. දිග සුසුමක් අරන් කතාවට මුල පිරුවා.

"ඔයාගේ අම්මා පුංචි කාලෙම එයාගේ තාත්තා අන්තරා වෙලා. ඉතින් එයාව ජීවත් කරන්න ඕන නිසා ඔයාගේ අම්මාගේ අම්මා පිටරට ගෘහ සේවයට ගිහින් තිබුණා. එයා රට යනකොට එයාගේ නංගිට ඔයාගේ අම්මාව බාර දීලා තමයි ගිහින් තියෙන්නේ. එදා ඉඳලා පුංචි අම්මයි බාප්පයිලු අම්මාව බලාගත්තේ. අම්මා කියූ විදිහට ඒ අය හරිම නපුරු යි."

"ඔයාගේ ආච්චි අම්මා රට ඉඳලා එවන සල්ලි ඔක්කොම ඒගොල්ලන් අරගෙන අම්මාට හරියට කන්න බොන්න දීලත් නෑ. ඉතින් අම්මාට ඉගෙන ගන්න බැරිවෙලා. ඒ දවස්වල එයා හිත හදාගෙන තියෙන්නේ ඔන්න ඔය කතන්දර පොත කියවලා තමයි. ඉතින් ඒ පුංචි කාලේ ඔයාගේ අම්මා හිතලා තියෙනවා, ඒ සුරංගනා කතාවේ විදිහට කවුරුහරි ඇවිත් එයාවත් බේර ගනීවි කියලා. ඉතින් ඔහොම කාලයක් යනකොට අම්මාට ඔයාගේ

තාත්තාව මුණගැහිලා තියෙනවා. දන්නවද, අම්මා ඉතින් හිතලා තියෙන්නේ ඒ සුරංගනා කතාවේ වගේ එයාව බේරගන්න ආව වීරයා තමයි තාත්තා කියලා. ඒත් එක්ක හීන ගොඩාක් හදාගන්න අම්මා බාප්පටයි පුංචිටයි හොරෙන් තාත්තා එක්ක යන්න යනවා."

"ටිකක් කාලයක් යනකොට, හරියට ඉන්න හිටින්න තැනක් නැති නිසා, බාප්පයි පුංචියි අම්මාට අයිති ගෙදරට ඇවිත් ඉන්න කියලා, ඔයාගේ අම්මාට සමාව දීලා තිබුණා. කාලයත් සමග තමයි අම්මාට තේරිලා තියෙන්නේ තාත්තා අම්මා හිතපු සුර කුමාරයා නෙමෙයි කියලා. එයා යාළුවන් එක්ක යන්නයි, බොන්නයි පටන් ගත්තු නිසා ඔයාගේ අම්මා ගෙදර තනිවෙලා තිබුණා. ඒ විතරක් නෙවෙයි, හැමදාම වගේ අඬ දබර, ගුටි බැට. මේවා මැදින් තව ටිකක් යනකොට අම්මට වැඩිපුරම දුක දැනිලා තිබුණේ දැන් ඔය ගෙදර ඉන්න කුඩම්මා එක්ක තාත්තාගේ පරණ සම්බන්ධයක් තියෙනවා කියලා දැන ගත්ත දවසේ. ඉතින් අම්මා හරියට හිතෙන් විඳෙව්වා."

"ඔහොම කාලයක් යනකොට තමයි ඔයාව ලැබෙන්න ඉන්න බව අම්මා දැනගත්තේ. ඊට පස්සේ රෝහලට ගිහින් අදාළ පරීක්ෂණ කරනකොට එයාගේ වකුගඩුවල ආබාධයක් තිබෙන බව හොයාගෙන තිබුණා. පස්සේ බලනකොට ඒක පිළිකාවක් කියලා දැනගත්තා. එදා නම් ඔයාගේ අම්මාට දරාගන්න බැරි වේදනාවක් දැනුණා කියලා මට කීවා. ඒත් පුංචි කාලයේ ඉඳලා ප්‍රශ්නවලටම මූණ දීලා අම්මාගේ හිත හොඳටම හයිය වෙලයි තිබුණේ. දරුවට ප්‍රශ්නයක් නෑ කියලා තිබුණු නිසා ඔයාව මේ ලෝකයට බිහි කරන්න අම්මා හිතාගෙන තිබුණා. ඒත් වෛද්‍යවරු ඔයාව කුසෙන් අයින් කළොත්

අම්මාගේ පිළිකාවට ප්‍රතිකාර කරන්න ලේසි වෙයි කියලා කියා තිබුණා. ඒ වෙලාවේ ඔයාගේ අම්මා ඒක දැඩි සේ ප්‍රතික්ෂේප කරලා ඔයාව මේ ලෝකයට බිහිකරන්න වෛද්‍යවරුන්ගෙන් උදව් ඉල්ලලා තිබුණා.”

“ඔයාව නිරෝගි ව මේ ලෝකයට බිහි කළත්, ප්‍රතිකාර ගත්තා වුණාට අම්මාගේ පිළිකාව ටික ටික වැඩි වුණා. තාත්තාගෙන් ප්‍රශ්න එන්න පටන් ගත්ත කාලේ තමයි හිත හදා ගන්න ඔයාගේ අම්මා මා ළඟට එන්න පුරුදු වුණේ. ඉතින්, පිළිකාවත් එක්ක ඉදිරියට යන්න ලොකු ස්වාමීන්වහන්සේ වාගේ ම අපි හැමෝම එයාට උදව් කළා. මගෙන් කමටහන් ගත්ත අම්මා පහුවෙනකොට හොඳටම සතිය දියුණුකර ගත්තා. එයාගේ රෝගයටත් හොඳින් මුහුණ දුන්නා. ඒ නිසා එයා කවදාවත් ඔයාගේ තාත්තා එක්ක තරහා වුණේ නෑ. තාත්තාට වෛර කළේත් නෑ.

ඔයාට මේ පොත නොදී, දවසක් මට මේ පොත ගෙනත් දීලා, ඔයාගේ අම්මා මෙහෙම කීවා, “අනේ මෙහෙණින් වහන්ස මට ඔබ වහන්සේගෙන් ලොකු උදව්වක් උවමනා යි. වෛද්‍යවරු කියන විදිහට මම තව වැඩි කාලයක් ජීවත් වෙන එකක් නෑ. යාන්තමට මගේ කෙලි පැටික්කිට අවුරුදු අටයි. එයාට මේ මොනවත් තේරෙන්නේ නෑ. හදිසියේවත් මම මළොත් කෙල්ල තනි වෙනවා. එයාගේ තාත්තා ගැන මට කිසි ම විශ්වාසයක් නෑ. මෙතැන තියෙන්නේ මගේ ගේ දොර ඉඩකඩම්වල ඔප්පු තිරප්පු. ඊට අමතරව මේ කතන්දර පොත. මම පුංචි කාලේ හිත හදාගත්ත, මගේ පිහිටට හිටිය කතන්දර පොත. මම හිතුවා ඒක මගේ දුවට දැන්ම දෙන්නේ නෑ කියලා. මොකද, මම මේ පොත කියවලා පුංචි කාලේ

හිතුවේ මගේ ජීවිතයත් කවදා හරි ලස්සන වසිලිස්සා වගේ මමත් අහිංසක නිසා මායා බලයකින් හෝ සුර කුමාරයෙක්ගේ පිහිට ලැබිලා හරි වෙනස් වෙයි කියලා. ඒත් සැබෑ ජීවිතයට මුහුණ දෙනකොට තමයි මට තේරුණේ ජීවිතයට මුහුණ දෙන්න ඕන අපේම ශක්තියෙන් කියලා. ඒකට තියෙන එකම උදව්ව කල්‍යාණ මිත්‍රත්වය විතරමයි කියලා ඔබ වහන්සේ මුණගැහුණාට පස්සේ මම ඉගෙන ගත්තා. ඉතින් මට ලබා දුන්න කල්‍යාණ මිත්‍රත්වය නිසා අද මම මැරෙන්නවත් බය නෑ. මගේ මේ කයේ වේදනාව දැන් මට භාවනාවක් වෙලා. ඔබ වහන්සේට වගේම ලොකු ස්වාමීන් වහන්සේ ඇතුළු සියළුම කල්‍යාණ මිත්‍රයන්ට බොහෝම පින්. ඒ විතරක් නෙවෙයි මම මිය ගියාට පස්සේ මගේ දරුවාටත් ඒ කල්‍යාණ මිත්‍රත්වය ලබාදෙනවා කියලා ඔබ වහන්සේ මට පොරොන්දු වෙනවා නේද? මේ ලිපි ලේඛන සමඟ මගේ අත්සන ඇතිව මම ලිපියක් ලියා තියෙනවා. වසිලිස්සාගේ තාත්තා මට විශ්වාස නැති නිසා කුමක් හෝ හදිසි අවස්ථාවකදී ඔබ වහන්සේගේ භාරයට දරුවාව පත්කරන්නට කැමතියි කියලා තමයි ඒකේ ලියලා තියෙන්නේ." කියා ඇය එදා මේවා මට භාර දුන්නා." කථාව නතර කරලා දිගු සුසුමක් හෙලූ මෙහෙණින්වහන්සේ කඳුළු පිරුණු මගේ දෑස් සෙමෙන් පිස දැම්මා.

"ඔයාගේ අම්මා කොච්චර දුබල වෙලා සිටියත් හරිම විශ්වාසයෙන් තමයි අවසාන මොහොත දක්වාම කථා කළේ. එකම කඳුලක්වත් හෙලුවේ නෑ. ඇත්තෙන්ම, එයා ජීවිතය ගැන හොඳ අවබෝධයකින් තමයි සිටියේ. ඉතින් මමත් එදා එයාට පොරොන්දු වුණා ඔයාව බලාගන්න. ඉන්පස්සේ අම්මා මගෙන් ඇහුවා, "පුංචි වසිලිස්සාට මේවා පහදන්න බැරි නිසා, එයාට අන්තිමට අර කතාවේ වසිලිස්සාගේ අම්මා බෝනික්කා දුන්නා වාගේ, මොනවද

මම හිත හදන්න එයාට දෙන්නේ?" කියලා. එදා තමයි මම ඔයාගේ අම්මාට කීවේ, ඔයාගේ මුළු ජීවිතයම වෙනස් කළ සතිමත් බව ඔයාගේ වසිලිස්සාගේ යාළුවා කරමු කියලා. ඒ වෙනකොට අපේ සති පාසල ආරම්භ කළා පමණයි. ඉතින් එයාට සති පාසලට එන්න කියන්න කියලා මම අම්මාට කිව්වා."

"එයින් දවස් දෙක තුනකට පස්සේ තමයි අම්මා අපෙන් සමුගත්තේ. අපේ චාමර ගුරුතුමයි නීතා ගුරුතුමියයි, හැමතිස්සේම ඔයා දිහා ඇහැගහගෙන ඉන්න කියලා මම යොදවලා හිටියේ. එහෙම තමයි අන්තිමට පාසල් නොයවා ගෙදර වැඩ ගත්ත කුඩම්මාගෙන් අපි ඔයාව බේරා ගත්තේ. ඉතින් අම්මා එදා ආදරය කරපු වසිලිස්සා පොත තමයි මම අද ඔයාට තෑගි කළේ. එදා හිටිය ලස්සන වසිලිස්සාට වඩා මට නම් අපේ වසිලිස්සා ගැන ගොඩක් ආඩම්බර යි. ඇත්තට ම ඔයා තමයි, සතිය නිසා ජීවිතය දිනපු සතිමත් වසිලිස්සා."

වසිලිස්සාගේ දෑස් කෙවෙණි අගින් පුංචි කඳුළු බිඳුවක් බිමට වැටුණා. දුක, සතුට දෙකම ඒ කඳුළු බිඳුවේ තැවරී තිබුණා.